සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

# නාට්‍ය හා රංග කලාව

**7 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 - 05 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 නළුවා පෙර සූදානමකින් තොරව සිදුකරනු ලබන්නකි.

(i) අනුකරණය (ii) අභිරූපණය

(iii) අනුරූපණය (iv) ක්ෂණික නිරූපණය

02 "සුවඳ පද්ම ඕලු ආදි නොයෙක පුෂ්පයෙන් සැදී" ගීතය ඇතුලත් නූර්තිය වන්නේ,

(i) දුටුගැමුණු (ii) වෙස්සන්තර

(iii) සිරිසඟබෝ (iv) විධුර

03 "සිංහල ඉතිහාසපොතේ රන් අකුරින් ලියැවුනා" යන ගීතයෙන් කියැවෙන වීර චරිතය වන්නේ,

(i) විහාරමහා දේවි (ii) මද්දුම බණ්ඩාර

(iii) කැප්පෙටිපොල දිසාවේ (iv) සෝමා දේවි

04 ළමා නාට්‍යයක් නොවන්නේ,

(i) පුංචි අපට දැන් තේරෙයි (ii) කැළණි පාලම

(iii) අමරගියා දිව්‍යලෝකේ (iv) ටිකිරි මැණිකේ.

05 පරිසරයේ සිදුවන ස්වභාවික සංසිද්ධියක් නොවන්නේ,

(i) හිරු නැගීම (ii) සුළං හැමීම (iii) මල් පිපීම (iv) රිය පැදවීම

- පහත වගුව අදාළ කරගනිමින් අංක 06 - 10 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

| (අ) | (ආ) |
|---|---|
| එදිරිවීර සරත්චන්ද්‍ර මහතා | A |
| B | රේඛාව |
| පාලිත ලොකුපෝතාගම මහතා | C |
| D | පුංචි අපට දැන් තේරෙයි |
| ටයිටස් තොටවත්ත මහතා | E |

06 A ට අදාළ නිවැරදි පිළිතුර වන්නේ,

(i) නරිබෑනා (ii) විකෘති (iii) මනමේ (iv) තලමල පිපිලා

07 B ට අදාළ නිවැරදි පිළිතුර වන්නේ,

(i) දයානන්ද ගුණවර්ධන මහතා (ii) ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා

(iii) ප්‍රේමසිරි කේමදාස මහතා (iv) ඩබ්ලිව්. ඩී. අමරදේව මහතා

08 C ට අදාළ නිවැරදි පිළිතුර වන්නේ,

(i) අමරගියා දිව්‍යලෝකෙ (ii) වළහා සහ මාෂා

(iii) ටිකිරි මැණිකේ (iv) තොප්පි වෙළෙන්දා

09 D ට අදාළ නිවැරදි පිළිතුර වන්නේ,

(i) සුගතපාල ද සිල්වා මහතා (ii) ඩී. කුමාරගේ මහතා

(iii) අමිතා රබ්බිඩිගල මහත්මිය (iv) සෝමලතා සුබසිංහ මහත්මිය

10 E ට අදාළ නිවැරදි පිළිතුර වන්නේ,

(i) හඳයා (ii) බැම්බි (iii) ජන්ගල් බුක් (iv) සිඳු

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට හරි නම් (✓) ලකුණ ද , වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

11 ක්ෂණික නිරූපණයෙහි යෙදීමෙන් ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව වර්ධනය වේ. ( )

12 නාට්‍ය ගීත ගායනා කලයුත්තේ හැඟීම් ප්‍රකාශවන පරිදිය. ( )

13 සාමූහිකව කතන්දර ගෙතීම සිදුකළ නොහැක. ( )

14 නාට්‍ය කලාවේ ප්‍රධාන අරමුණ වන්නේ රංගන හැකියාව වර්ධනය කර ගැනීමයි. ( )

15 නළුවකු රංග අභ්‍යාස කිරීම අත්‍යවශ්‍ය වේ. ( )

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

( බුද්ධදාස රජු, නම් පොත, වේෂභූෂණ, උලමා, කය සහ මනස, ගජබා රජු )

16 ........................................................................................ කියවීමේ දී එහි ඇති රිද්මය අවබෝධ කරගත යුතුය.

17 පාළු බව නිරූපණය කිරීමේදී ....................................................................... ගේ හඬ අනුකරණය කළ හැකිය.

18 වෙදකමයි - රජකමයි සිදුකල රජතුමා වූයේ .................................................................................. රජතුමා ය.

19 රංගනයේ දී ................................................................................... අතර මනා සබඳතාවක් තිබිය යුතුය.

20 ............................................................................................................. ආහාර්ය අභිනයට අයත් වේ.

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

01 වැඩ ඇති විට අතපසු නොකරන්නේ

අද දවසට වැඩ අද කරපන්නේ

........................................ ........................

........................................ ........................

(i) ඉහත කවිය සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

(ii) ඉහත කවිය ඇතුළත් කෘතිය නම් කරන්න. (ලකුණු 02)

(iii) එම කෘතිය රචනා කළේ කවුරුන් විසින්ද? (ලකුණු 02)

(iv) සිරිත් - විරිත් යන්න හඳුන්වන්න. (ලකුණු 02)

(v) මෙම කෘතියේ ඔබ කියවූ කවි පංති තුළ ඇති සිරිත් විරිත් 02 බැගින් නම් කරන්න. (ලකුණු 02)

02 (i) ශ්‍රව්‍ය මාධ්‍යයක් හා ශ්‍රව්‍ය -දෘශ්‍ය මාධ්‍යයක් නම් කරන්න. (ලකුණු 02)

(ii) රූපවාහිනිය තුළ විකාශනය වන වේදිකා නාට්‍ය පිළිබඳ වැඩසටහන් 03 ක් නම් කරන්න.(ලකුණු 03)

(iii) ටෙලි නාට්‍යයක හා වේදිකා නාට්‍යයක විශේෂතා 3 බැගින් ලියන්න. (ලකුණු 05)

03 (i) පරිකල්පනය යනු කුමක්ද? (ලකුණු 03)

(ii) පරිකල්පනය වර්ධනය කර ගැනීම සඳහා ඔබ විසින් පංති කාමරයේදී සිදු කළ රංග අභ්‍යාසය නම් කර එය සිදු කළ ආකාරය පියවරෙන් පියවර ලියන්න. (ලකුණු 07)

04 (i) වේෂ භූෂණ යන්න හඳුන්වන්න. (ලකුණු 02)

(ii) වේෂ භූෂණ නිර්මාණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් ලියන්න. (ලකුණු 03)

(iii) පහත සඳහන් චරිත 2 සඳහා වේෂ භූෂණ ඇඳ වර්ණ ගන්වන්න.

(අ) රජ (ආ) බිසව (ලකුණු 05)

05 (i) ඓතිහාසික කතා හා බැඳුණු වීර චරිත 04 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඔබ කැමති ඓතිහාසික කතාවක් ඇසුරින් නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්න. (ලකුණු 08)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. (iv) 02. ( i ) 03. (ii) 04. (ii) 05. (iv) 06. (iii) 07. (ii) 08. ( i ) 09. (iv) 10. ( i )

11. (✓) 12. (✓) 13. (X) 14. (X) 15. (✓)

16 නම්පොත　17 උලමා　18 බුද්ධදාස රජු　19 කය හා මනස　20 වේෂ භූෂණ

## II කොටස

01 (i) හෙට දවසට හෙම කල් නොදමන්නේ
නිසි කාලෙට නිසි වැඩ කරපන්නේ (ලකුණු 02)

(ii) සිරිත් මල්දම (ලකුණු 02)

(iii) ඇම්. අල් ද සිල්වා ගුරු මුහන්දිරම් තුමා (ලකුණු 02)

(iv) සිරිත් - කළ යුතු දේ, පිළිගත යුතු දේ
විරිත් - නොකළ යුතු දේ, අත්හල යුතු දේ (ලකුණු 02)

(v) පිළිතුරට අදාළව ලකුණු ලබා දෙන්න. (ලකුණු 02)

02 (i) ශ්‍රව්‍ය - ගුවන් විදුලිය, ශ්‍රව්‍ය - දෘශ්‍ය - රූපවාහිනිය (ලකුණු 02)

(ii) රංග භූමි, ඇහැට කනට, ආයුබෝවන් (ලකුණු 03)

(iii) ටෙලි නාට්‍යය

(I) කැමරා තාක්ෂණය භාවිතයෙන් පටිගත කිරීම.

(II) පටිගත කළ රූප රාමු සංස්කරණය කිරීම.

(III) සිද්ධි අනුපිළිවෙලින් පටිගත කිරීම අනවශ්‍ය වීම.

(IV) එම නිර්මාණයම නැවත නැවත නැරඹිය හැකි වීම.

වේදිකා නාට්‍යය

(I) සජීවී බව

(II) එක් අවස්ථාවක් නැරඹූ නාට්‍යයක් නැවත එලෙසම නැරඹිය නොහැකි වීම.

(III) රංග ගත කිරීම සඳහා නිශ්චිත ස්ථානයක් තිබීම වැනි නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න. (ලකුණු 05)

03 (i) අලුතෙන් යමක් සිතේ මවා ගැනීමේ හැකියාව (ලකුණු 02)

(ii) වෙද පුටුව
නිවැරදි පිළිතුර පියවරෙන් පියවර ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 03)

04 (i) රංග වස්ත්‍රාභරණ (ලකුණු 02)

(ii) චරිතයට ගැලපීම
සැහැල්ලු හා සරල වීම.
රංගනයට බාධා නොවීම.
නළුවාට පහසුවෙන් ඇඳ පැළඳ ගැනීමට හැකි වීම.

(iii) පිළිතුරු සැලකිල්ලට ගෙන ලකුණු ලබාදෙන්න.

05 (i) මද්දුම බංඩාර, දුටු ගැමුණු රජු, II රාජ සිංහ රජු, විහාරමහා දේවි, ගජබා රජු, වීර පුරන් අප්පු, කැප්පෙටිපොළ දිසාව..... (ලකුණු 02)

(ii) චරිත හා සංවාද භාවිතය, නාට්‍යෝචිත බව සැලකිල්ලට ගනිමින් ලකුණු ලබා දෙන්න. (ලකුණු 03)